පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 1457 / 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023
දිනය / திகதி / Date — 21/11/2023 පැය 2125

# මාධ්‍ය නිවේදනය

## බන්ධනාගාර ගතව සිටි සැකකරුවෙකු මිය යාම සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කිරීම.

යාපනය පොලිස් කොට්ඨාසයේ වඩුක්කෝට්ටෙ පොලිස් ස්ථානය වෙත වාර්තා වී තිබූ රාත්‍රී කාලයේ නිවසකට ඇතුළු වී පිහියක් පෙන්වා නිවැසියන් බිය ගන්වා මුදල් රුපියල් 90,000/= ක් හා පවුම් 16 ½ ක රන් භාණ්ඩ කොල්ලකෑමේ අපරාධය සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඉහත අපරාධය සම්බන්ධයෙන් 2023.11.11 වන දින රාත්‍රී කාලයේ වඩුක්කෝට්ටෙ පොලිස් වසමේ නාගකන්නී ප්‍රදේශයේදී සැකකරුවන් දෙදෙනෙකු වඩුක්කෝට්ටෙ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර 2023.11.12 වන දින මල්ලාකම් ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2023.11.21 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මෙසේ බන්ධනාගාර ගත කරන ලද වයස අවුරුදු 26 ක් වූ කාවනාවෙඩ්ඩි, සිත්තන්කෙනි ලිපිනයේ පදිංචිව සිටි එක් සැකකරුවෙකු බන්ධනාගාරය භාරයේ සිටියදී හදිසි අසනීප තත්ත්වයකින් පෙළීම හේතුවෙන් බන්ධනාගාර නිලධාරීන් විසින් ඔහුව ප්‍රතිකාර සඳහා යාපනය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු 2023.11.16 වන දින නැවත බන්ධනාගාරයට රැගෙන ඒමට කටයුතු කර ඇත. 2023.11.19 වන දින සැකකරු නැවත හදිසියේ අසනීප වීම හේතුවෙන් යාපනය රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති අතර ඒ සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන් විසින් ගරු අධිකරණයට දැනුම් දී ඇත.

සැකකරු මිය යාම සම්බන්ධව බන්ධනාගාර නියාමක නිලධාරියෙකු විසින් 2023.11.19 වන දින යාපනය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් සිදු කර ඇත. මියගිය සැකකරුගේ මෘත දේහය පිළිබඳව මරණ පරීක්ෂණය 2023.11.20 වන දින යාපනය රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් සිදුකිරීමෙන් අනතුරුව, ශරීරයේ සිදු වූ තුවාල හේතුවෙන් වකුගඩු ක්‍රියාකාරිත්වය අවහිර වී මෙම මරණය සිදුව ඇති බවටත්, මේ සම්බන්ධව වැඩිදුර විමර්ශන සිදු කිරීමට ඇති බවටත් සඳහන් කරමින් වාර්තාවක් ලබා දී ඇත.

ඒ අනුව අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ වාර්තාව පදනම් කර ගෙන මෙම සැකකරුගේ හදිසි මරණය සම්බන්ධයෙන් යාපනය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කන්කසන්තුරය කොට්ඨාසයට අනුයුක්ත සහකාර පොලිස් අධිකාරිවරයෙකුගේ

ප්‍රධානත්වයෙන් යුතුව යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලබයි. මෙම විමර්ශනයෙන් පසු යම්කිසි ආකාරයකට පොලිස් නිලධාරීන් විසින් අපරාධමය වරදක් සිදුකර ඇති බවට අනාවරණය වුවහොත් ඔවුන්ට එරෙහිව අපරාධ නීතිය යටතේ ද එමෙන්ම යම් විනය කඩ කිරීමක් වාර්තා වුවහොත් ඔවුනට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමටද ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියා කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**